එක් එක් පුද්ගලයන්ගේ විවිධ මුහුණුවල ලක්ෂණ, රූපනයේදී චරිතයන්ට ගැලපෙන පරිදි වෙනස්කර ගැනීම අංගරචනය වේ.

අංග - නළල, ඇස්, නාසය, කට, කන්, අත් පා යනාදී කොටස්ය.

රචනය - වර්ණ හා හැඩතල උපයෝගි කරගනිමින් සම්පිණ්ඩනාත්මක නිර්මාණකරණයක නිරත වීමයි.

මෙය ආහාර්ය අභිනයට අයත් වේ. අඳුර හා එළිය පිළිබඳ මූලධර්මය අංග රචනයේ දී විශේෂයෙන් වැදගත් වේ.

- අංග රචනය මගින් විවිධ චරිත නිරූපනය කල හැක
- බාහිර මෙන්ම අභ්‍යන්තර චරිත ලක්ෂණ නිරූපණයකිරීම සඳහාද අංග රචනය ඉවහල් වේ.
- ප්‍රේක්ෂකයාගේ විශ්වාසය දිනාගත හැකි වීම.
- නාට්‍යයේ ශෛලිය අනුව අංග රචනය වෙනස් වේ.

<u>අංග රචනා ශිල්පියෙකු අවධානය යොමු කළ යුතු කරුණු</u>

- රංගන ශිල්පියාගේ මුහුණෙහි හැඩය, සමේ වර්ණය පිළිබඳ අවබෝධය
- ගැලපෙන වර්ණ භාවිතා කිරීම
- නාට්‍යයෙහි ශෛලිය
- චරිතය, චරිතයේ ස්වභාවය, දේශය, ජීවත්වන කාලය, සමාජීය, ආර්ථික හා ආගමික ආදී තත්වයන් පිළිබඳ අවබෝධය
- ආලෝකය, පසුතල හා ඇඳුම් පැළඳුම් සඳහා භාවිතා වර්ණයන් පිළිබඳ අවධානය යොමුකිරීම.

අංග රචනය ප්‍රධාන වශයෙන් වර්ග කීපයකට බෙදා දැක්විය හැක.

(1) Straight - ස්ට්‍රේට් හෙවත් ඍජු, සරල, ස්වභාවික
(2) Character - චරිතාංග (චරිත)
(3) Stylized - ශෛලිගත
(4) Fantastic - විකාර රූපී, විහිළු ආකාර, කෝලම්

(1) සරල අංග රචනයක් යනු කෙනෙකුගේ පවත්නා, බාහිර ස්වරූපය ඒ අයුරින් ඉදිරිපත් කිරීමයි.

(2) චරිතාංග අංග රචනයක් යනු කෙනෙකුගේ බාහිර ස්වභාවය වෙනත් අයුරකින් අංග රචනා කර ඉදිරිපත් කිරීමයි. චරිතයන්ට අදාලව නිර්මාණශීලීව අංග රචනයන් සිදු කිරීමයි.

(3) ශෛලිගත අංග රචනයේදී සාමාන්‍ය ස්වභාවයට වඩා නාට්‍යයේ ශෛලියට අනුව අංගරචනා කිරීම කිසියම් මෝස්තරයකට අනුව සිදුවේ.

(4) විකාර රූපී අංග රචනය ඇතැම් විට වෙස් මුහුණු වල ස්වභාවය උසුලයි.

(ලකුණු 5)

06. (i) ප්‍රධාන අංග රචනා වර්ග මොනවා ද? (ලකුණු 2)

(ii) එම අංග රචනා වර්ග අතර ඇති වෙනස පහදන්න. (ලකුණු 4)

(iii) වේදිකා නාට්‍යයක අංග රචනා කිරීමේ කාර්යය සිදුකිරීමට පෙර, සැලකිල්ලට ගත යුතු කරුණු 6ක් පිළිබඳව කෙටියෙන් දක්වන්න. (ලකුණු 6)

07. පහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න.

තමාගේ දරුවා වන සඳරුවන් විභාගයෙන් අසමත් වී ඇති බව කාර්යාලයේදී අන්තර්ජාලයෙන් දැනගන්නා පියා කෝපයෙන් නිවසට පැමිණෙයි. සඳරුවන් තම මව සමඟ පියා නිවසට පැමිණෙන තුරු බලා සිටියි.

- නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 4)
- සංවාද සහ රංග විධාන සහිතව නාට්‍ය පෙළ රචනා කිරීම සඳහා (ලකුණු 8)